72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව.
දු.ක: +97 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල:: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**
දිනය: 2022 අප්‍රේල් 27 බදාදා
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව. 0800

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**
ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**
ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර් : @ravirannaneliya

# ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලය තුලින් සියලුම දේශපාලඥයින් කෙරෙහි ඇති මහජන අප්‍රසාදය වැඩි වී ඇති අතර මෙය වඩාත් නරක ලෙස බලපා ඇත්තේ ජනාධිපති රාජපක්ෂටය.

වත්මන් ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලය වන්නේ සියලුම දේශපාලඥයින් කෙරෙහි පුලුල් මහජන අප්‍රසාදය ඇති වීමයි. සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනයේ (IHP) SLOTS මත විමසුමේදී, ආණ්ඩුවේ සහ විපක්ෂයේ දේශපාලනඥයන් කෙරෙහි ජනතා මනාපය පහළම මට්ටමට වැටී ඇත. වඩාත් නරක ලෙස බලපෑමට ලක්ව ඇත්තේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන අතර, 2021 අගෝස්තු-සැප්තැම්බර් මෙරට අගුලු දැමූ කාලයේ ජනතා ප්‍රසාදය ශ්‍රේණිගත කිරීම් +50 වන ඉහළ අගයක සිට 2022 අප්‍රේල් මාසයේදී එය -80 දක්වා පහත වැටී ඇත.

IHP SLOTS මත විමසුම මඟින් 2021 සැප්තැම්බර් මාසයේ සිට දේශපාලනඥයින් සහ තෝරාගත් ආයතන පිලිබඳ ජනතා ප්‍රසාදය නිරීක්ෂණය කර ඇත. එතැන් සිට 2022 ජනවාරි මාසය දක්වා ජනාධිපති රාජපක්ෂ මහජනතාව සමඟ ඉහළ ප්‍රසාද ශ්‍රේණිගත කිරීම් පවත්වා ගෙන ගියේය. ඊට සාපේක්ශව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස පිලිබඳ ජනතා ප්‍රසාදය ශ්‍රේණිගත කිරීම් බොහෝ විට සෘණාත්මක විය. නමුත් පසුගිය මාස දෙක තුළ මේ සියල්ල වෙනස් විය. ජනාධිපතිවරයාගේ ජනතා ප්‍රසාදය ශ්‍රේණිගත කිරීම් පහත වැටී ඇත.

ජනාධිපති රාජපක්ෂගේ ශුද්ධ මනාපය පෙබරවාරි මාසයේදී +20 සිට අප්‍රේල් පළමු සති තුන තුළ -80 ට වඩා අඩු අගයක් දක්වා පහත වැටුණි, මෙමගින් ඔහු ගැන හිතකර මතයක් ඇති සෑම මහජන සාමාජිකයෙකුටම සාපෙක්ශව ඔහු පිලිබඳ අප්‍රසාදය පළ කරන තවත් නව දෙනෙක් ඇත. මෙම පක්ෂග්‍රාහීභාවය පහත වැටීම අනෙකුත් බොහෝ දේශපාලනඥයන්ට වඩා වේගවත් හා පුළුල් ආකාරයකින් වී ඇත. මාර්තු-අප්‍රේල් කාලය තුළ ජනාධිපතිවරයාගේ ජනතා ප්‍රසාදය ශ්‍රේණිගත කිරීම (-40), අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ (-33) සහ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස (-26) යන දෙදෙනාටම වඩා පහත අගයක ට පත් වී ඇත.

ජනාධිපතිවරයා කෙරෙහි ඇති ප්‍රසාදයෙහි විශාලතම අඩුවීමක් සිදුව ඇත්තේ දිළිඳු, කාන්තාවන්, නාගරික සහ සිංහල වැඩිහිටියන් අතරය. ශ්‍රී ලාංකිකයන්ගෙන් තුනෙන් එකක් වන දිළිඳු ප්‍රජාව විසින් සජිත් ප්‍රේමදාස මහතාට දී ඇති සෘණාත්මක අගයටත් (-6) වඩා වැඩි සෘණාත්මක ජනතා ප්‍රසාදය ශ්‍රේණිගත කිරීමක් (-63) ජනාධිපතිවරයා කෙරෙහි පළ කර ඇත. කාන්තාවන් සම්බන්ධයෙන් ගත් කල, බොහෝ කලක සිට සජිත් ප්‍රේමදාස මහතාට වඩා පක්ෂග්‍රාහී බවක් භුක්ති විඳිමින් සිටි ජනාධිපතිවරයාට එම පක්ෂග්‍රාහී බව අහිමි වී ඇත. කාන්තාවන් මේ මොහොතේ මෙම දෙදෙනාටම අප්‍රසාදය පළ කරන නමුත් විපක්ෂ නායකවරයාට (-27) වඩා ජනාධිපතිවරයා (-42) පිලිබඳ අප්‍රසාදය වැඩි වී ඇත. විපක්‍ෂ නායක සජිත් ප්‍රේමදාස කෙරෙහි ඇති ජනතා ප්‍රසාදය අඩු වීම වඩා අඩු අගයකින් සිදුව ඇති අතරම එය ජනාධිපතිවරයාට වඩා අඩුවෙන් සිදු වුවද, කාන්තාවන් තුළද ඔහු පිළිබඳව ඇති ප්‍රසාදය සැලකිය යුතු මට්ටමකින් පහත වැටී තිබේ.

SLOTS සමීක්ෂණයේ කලින් ජනප්‍රියම ඇමතිවරිය වූ ආචාර්ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ ඇතුළු සියලුම දේශපාලනඥයන් කෙරෙහි ඇති ප්‍රසාදය පහත වැටී ඇත. එජාප නායක රනිල් වික්‍රමසිංහගේ ද, ඊටත් වඩා ජවිපෙ නායක අනුර දිසානායකගේ ද ජනතා ප්‍රසාදය ශ්‍රේණිගත කිරීම් පහළ වැටී ඇත.

මීට අමතරව, සෞඛ්‍ය අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව සහ GMOA ඇතුළු රාජ්‍ය ආයතන සහ අනෙකුත් සංවිධානවල ජනතා ප්‍රසාදය ශ්‍රේණිගත කිරීම් සුළු වශයෙන් පහත වැටී ඇත. මහජන අප්‍රසාදය විශේෂයෙන්ම දේශපාලකයන් කෙරෙහි ඇති බව පෙන්නුම් කරයි.

IHP හි විධායක අධ්‍යක්ෂ ආචාර්ය රන්නන්-එලිය අදහස් දක්වමින් කියා සිටියේ, සියලුම දේශපාලඥයින් කෙරෙහි මහජන අප්‍රසාදය ඉහළ මට්ටමින් පැවතීමෙන් ගම්‍ය වන්නේ වර්තමානයේ කිසිදු දේශපාලන පක්ෂයකට අර්බුදය විසඳිය හැකි බවට මහජන විශ්වාසයක් නොමැති බවයි. සමාජයේ විවිධ කොටස්වල, විශේෂයෙන්ම දිළිඳු ප්‍රජාවගේ කැමැත්ත ඇති වන පරිදි අදාල පියවර සකස් කර එය සන්නිවේදනය කිරීම සහ ඉදිරි මාස කිහිපය තුළ ඇති වන ගැටලුකාරී තත්වය පාලනය කර ගැනීමට අවශ්‍ය නායකත්වය ලබා දී ම සඳහා උපකාරි වන නැවුම් චින්තනය, දේශපාලන සංස්ථාපිතය තුලින් පෙන්වා දෙන බව ඔහු පැවසීය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනයේ ශ්‍රී ලංකා අදහස් එකතු කිරීම පිළිබඳව සමීක්ෂණය Sri Lanka Opinion Tracker Survey (SLOTS) යනු සමස්ත ලංකාවම නිරූපනය කළ හැකි නියැදියක් සමග, සෑම දිනකම සම්මුඛ සාකච්ඡා සිදු කර, එදිනෙදා ජීවිතය සහ ඔවුන්ගේ අදහස් පිළිබඳ දුරකථන මාර්ගයෙන් ප්‍රශ්න විමසා බලන සමීක්ෂණයකි. SLOTS සමීක්ෂණය තුලින්, ප්‍රසිද්ධ චරිතයක් හෝ ආයතනයක් ගැන හිතකර හෝ අහිතකර මතයක් තිබේ දැයි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් විමසීමෙන් ජනතා ප්‍රසාදය නිරීක්ෂණය කරයි: ශුද්ධ මනාපය ධනාත්මක සහ සෘණ ප්‍රතිචාරවල සාමාන්‍යය වේ. ලකුණු +100 (සෑම කෙනෙකු තුළම ප්‍රසාදයක් ඇත) සිට -100 දක්වා (සෑම කෙනෙකු තුළම අප්‍රසාදයක් ඇත). IHP විසින් වාර්තා කරන ලද ඇස්තමේන්තු, සමස්ත ජනගහනයේ ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ආදායම් මට්ටම, ජනවාර්ගිකත්වය, අංශය, පළාත සහ 2019 ජනාධිපතිවරණයේ දී ජනතාව ඡන්දය ප්‍රකාශ කළ ආකාරය නිරූපනය කරන බව සහතික කිරීම සඳහා එම සමීක්ෂණ ප්‍රතිචාර නැවත සකස්කර ඇත. 2021 සැප්තැම්බර් මාසයේ සිට 2022 අප්‍රේල් 24 දක්වා කාලය තුළදී වැඩිහිටියන් 4,603ක් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා මත මෙම හිතකර සොයාගැනීම් පදනම් වී ඇත.

**සම්පූර්ණ වාර්තා ihp.lk වෙතින් ලබා ගත හැකිය.**

Institute for Health Policy, April 2022, “SLOTS Favourability Ratings: Methodology for tracking public favourability”, SLOTS Report #2022-03.

Institute for Health Policy, April 2022, “Economic crisis results in growing public disaffection with politicians, but particularly with President Rajapaksa”, SLOTS Report #2022-04.

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP)**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත සමීක්ෂණ සිදු කර ඇත.

**අරමුදල්**

නීලන් තිරුචෙල්වම් භාරය සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් මෙම සමීක්ෂණයට අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP පර්යේශණ ආයතනය සම්බන්ධ කර ගත හැක.